# දර කියන කථාවක්



විදුලිය, තෙල්, ගෑස්වලට වගේ සමාජ තත්වයක් මට නැහැ. මම සේවය කරන්නේ පීඩිත පංතිය වෙනුවෙන්. මගේ ගෙදර කුස්සිය, ලිප මගේ සොහොයුරායි. මගේ සොහොයුරිය ගෘහණියයි. අපි එකතුවෙලා සමාජයට ලොකු මෙහෙවරක් කරනවා. ඒත් අප සියළු දෙනාම සමාජයේ අවතක්සේරු භාණ්ඩ. සමාජයේ ලොකු තැන් මෙන්ම, සමාජ සංවර්ධනය කරන නිලධා න්ටත් අපේ ගැන හැඟීමක් නැහැ. සියළු දේ භාර අවුස්සල සාමාජය දැනුවත් කරන මාධ්‍යටවත් අප ගැන සොයා බලන්න උවමනාවක් නැහැ. මම මුදල්වලට යටවෙලා නැහැ. මගේ සේවය නොමිලේ. නගරබද නම් මා ආර්ථික භාණ්ඩයක් වෙලා. මම අවලංගු භාණ්ඩයක් වුනාට මගෙන් වන සේවය අප්‍රමාණයි. එය පුරාජේරුවක් නම් නෙවේ. ඇත්තම ඇත්තයි. මගේ සේවය මමවත් මතක් කරලා දෙන්නම්කෝ.

- ලංකාව පුරා පාවිච්චි කරන සියළුම බලශක්ති ප්‍රමාණයෙන් 55% ක් සපයන්නේ මායි.
- ඉවුම් පිහිම් කටයුතුවලට මුළු රටේ ගෘහණියන්ගෙන් 88/100ක් විතර සේවයට ගන්නේ මාවයි.
- ලංකාවේ ආහාර පිසීමට ගන්නා බලශක්ති ප්‍රමාණයෙන් 76/100 පමණ ලබාගන්නේ මගෙන්මයි.
- වසරකට වැය වන මගේ ශ්‍රමයෙන් 76/100 පමණ ගන්නේ කුස්සිවලට, ඉතිරි 24/100 කර්මාන්තවලට.
- මගේ ශ්‍රමය අගය වසරකට ටොන් දශ ලක්‍ෂ 10 ක් පමණ වෙනවලු.
- මගේ ශ්‍රමයේ ආර්ථික වටිනාකමක් දුන්නොත් එය වසරකට ඩොලර් මිලියන 400 ක් පමණ වන බව ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය පවසනවා.

ඉතිං බලශක්ති ක්ෂේත්‍රයේ ඉන්න ලොකු ලොක්කන්ට මාව පේන්නේ නැහැ. ඒත් තෙල්, ගෑස්, විදුලියට තියෙන සැලකිල්ල මට නැති නිසා, ඉදිරි කාලයේදී මගේ ශ්‍රමය අඩු වෙයිද දන්නේ නැහැ. මට දුක මගේ ශ්‍රමය වෙනුවට විකල්පයක් සොයන එක ලෙහෙසි වෙන එකක් නැහැ. බලධා න් මේ ගැන දැන්වත් ඇස් ඇරලා බැලුවොත් නම් හොඳයි. හැබැයි ඔය තෙල් පප්පලා, ගෑස් කාරයෝ තව අවුරුදු 25කින් 30කින් විතර අන්තරස්දාන වෙනවලු. මම නම් එහෙම ලෙහෙසියෙන් අන්තරස්දාන වෙන්නේ නැහැ. ඔය ඛණිජ කාරයින්ට බැරි වුණාට, මට පුළුවන් නැවත, නැවතත් ජීවයක් ලබාගන්න. පුනර්ජීවය වෙනවයි කියලා කියන්නේ එකටලු. ධරණීය සංවර්ධනයටත් හිතකරලු. වැඩි කල් යන්න ඉස්සෙල්ලා මටත් පුළුවන් වෙයි මය තෙල් ගෑස් වගේ පෙනී සිටින්න. එතකොට මට නම්බුකාර නමක් ලැබෙනවා. ජීව ඉන්ධන කියලා. කුකර්වලට විතරක් නෙවෙයි විදුලිය නිපදවන්නත්, කාර් පණගන්වන්නත් මගේ සේවය ඕනෑ වේවී.

අනාගතය කොහොම වුනත් දැනට ලිපත්, ගෘහණියත් සමඟ එකතුවෙලා කුස්සියක් තුළින් සමාජ ගුණාත්මක තත්වයත්, ග්‍රාමීය කර්මාන්ත නංවන්න කරන සේවාවත් අදාල බලධා න්ට පෙනෙන්නේ නැත්තේ ඇයි ?

ආර්.එම්. අමරසේකර
ඒකාබද්ධ සංවර්ධන සංගමය (IDEA)
ගල්මඩුවවත්ත පාර,
කුණ්ඩසාලේ.